Annex I

# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை
The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823

කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458

වෙබ් අඩවි / வெப் தளங்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: TIP/SS/01/03

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2018.02.15

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : **01/2018**

ජනාධිපති ලේකම්
අග්‍රාමාත්‍ය ලේකම්
අමාත්‍ය මණ්ඩල ලේකම්
කොමිෂන් සභා ලේකම්වරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්

<u>සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය</u>

සහනදායී පදනම මත මෝටර් රථ බලපත්‍ර ලබාදීමට අදාල වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016, 01/2016 (I) සහ 01/2016 (II) චක්‍රලේඛ මෙමගින් අහෝසි කර ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි සේවය කරනු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක, පරිපාලන, කළමනාකරණ සහ වෘත්තීයමය තනතුරුවල නිරත වන නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමට / දේශීයව එකලස් කරන ලද මෝටර් රථ මිලදී ගැනීමට අදාල වන විධිවිධාන මෙයින් පනවනු ලැබේ.

මෙම බලපත්‍රය සහ එයට අදාල පහසුකම් කිසිදු ආකාරයකින් අයිතිවාසිකමක් ලෙස නොසැලකිය යුතු අතර රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඒවා යටත්වේ.

## 01. හිමිකම් ලබන අවස්ථා

රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි පහත සඳහන් ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් විධායක, පරිපාලන, කළමනාකරණ සහ වෘත්තීයමය තනතුරුවල නිරත වන එම තනතුරක හෝ තනතුරු කිහිපයක නියමිත සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා එම තනතුරු වල ස්ථිර සේවා කාලයක් ඇති නිලධාරීන් හට මෙම බලපත්‍රය හිමි වේ.

1.1 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි උප ලේඛණ III හි සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් තනතුරක වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති රාජ්‍ය නිලධාරීන්.

1.2 ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.3 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය ආයතනයන්හි (රජයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන හැර) "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.4 ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන් කර්නල්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වින්ග් කමාන්ඩර්, සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ කමාන්ඩර් තනතුරක හෝ ඊට ඉහල තනතුරක වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.5 වසර හයක (06) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති ත්‍රිවිධ හමුදාවන්හි වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, ගණකාධිකාරීවරුන්, වාස්තු විද්‍යාඥයින් හා නීතිඥ වරුන් ලෙස සේවය කරනු ලබන නිලධාරීන් (හමුදා නිලය නොසලකා).

1.6 අමාත්‍ය මණ්ඩල තීරණයකින් රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතනයක "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරකට පත්කර ඇති, එම තනතුරේ වසර දොළහක (12) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ එම තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.7 රජයේ විශ්වවිද්‍යාල වල අධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් තනතුරක හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවල "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.8 ශ්‍රී ලංකා මහ බැංකුවේ "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර දොළහක (12) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා එම තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්.

1.9
   i. රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සංඛ්‍යාව තුල ඇතුලත් 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි III වන උපලේඛණයේ සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර දොළහක (12) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති නිලධාරීන්;

   ii. රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත සේවක සංඛ්‍යාව තුල ඇතුලත් 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016 හි III වන උපලේඛණයේ සඳහන් "ජ්‍යෙෂ්ඨ මට්ටම" ට අයත් විධායක තනතුරක වසර නවයක (09) සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා තනතුරෙහි ස්ථිර කර ඇති වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන් හා වරලත් වාස්තු විද්‍යාඥයින්.

1.10 විශ්වවිද්‍යාල කුලපති වරුන්.

1.11 "ලියාපදිංචි වෛද්‍ය නිලධාරී" තනතුරක පළමුවන ශ්‍රේණියේ වසර හයක (06) ක සක්‍රීය සේවා කාලයක් සහිත තනතුරේ ස්ථිර කර ඇති "ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන්".

1.12 රජයේ සංවර්ධන ව්‍යාපෘතියක (කොන්ත්‍රාත් පදනමින් හෝ) වසර නවයක (09) සක්‍රීය සේවා කාලයක් හිමි හෝ ව්‍යාපෘති කිහිපයක කලින් කලට සේවය කරන ලද සේවා කාලයන් එක්ව ගත් කල වසර නවයක (09) සක්‍රීය සේවා කාලයක් (කොන්ත්‍රාත් පදනමින් හෝ) සහිත මේ වන විටත් සේවයේ නියුතු ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන්, වරලත් ඉංජිනේරුවන්, වරලත් ගණකාධිකාරීවරුන්, වරලත් වාස්තු විද්‍යාඥයින් හා නීතිඥවරුන්.

1.13 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සලසා ඇති විධිවිධාන ප්‍රකාරව පිහිටුවා ඇති කොමිෂන් සභාවක වසර තුනක (3) සක්‍රීය සේවා කාලයක් සහිත කොමිෂන් සභා සභාපතිවරුන් හා සාමාජිකයින්.